DOI : 10.31357/fhssmst.2014.00665

# බටහිර ජාතීන්ගේ පාලන සමයේ ලක්දිව නීති සහ අධිකරණ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස් වීම් පිළිබඳ විමර්ශනය කිරීම

2014

නම : ඒ.එස්.පී.එස්.පී. සංජීව

ලියාපදිංචි අංකය : GS/MA/HIST/ 3100/07

02 JUL 2015

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉතිහාසය ශාස්ත්‍රපති (MA) දෑ අවුරුදු සපර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධනයකි.

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ....මහාචාර්ය S.D.N. ධර්මරත්න මහතා....

ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි. එසේම 2015.06.22 වන දින පැවති වාචික පරීක්ෂණයේ දී දැන්වූ පරිදි සහ පරීක්ෂකතුමන්ලාගේ වාර්තාවල සඳහන් වූ ආකාරයට අදාළ සංශෝධන සිදු කළ බව ද සහතික කරමි.

01/07/2015
දිනය

Saman.
අපේක්ෂකයාගේ අත්සන

# උපදේශකගේ ප්‍රකාශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධනය 2015.06.22 වන දින පැවති වාචික පරීක්ෂණ මණ්ඩලයේ දී දැක්වූ සහ පරීක්ෂකතුමන්ලාගේ වාර්තාවල සඳහන් වූ සංශෝධන සිදු කිරීමෙන් පසු මා වෙත ඉදිරිපත් කරන ලදුව මා විසින් පරීක්ෂා කළ බවත් මෙම නිබන්ධනය අවශ්‍ය මට්ටමට පවතින බවත් දෑ අවුරුදු සපර්යේෂණ උපාධිය පිරිනැමීම සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

2015.07.02

..............................

උපදේශකතුමාගේ අත්සන

මහාචාර්ය නන්ද ධර්මරත්න

ස්තුතිය

මෙම නිබන්ධය මා විසින් පිළියෙල කරනු ලැබුයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති දෑඅවුරුදු සපර්යේෂණ උපාධිය පාඨමාලාව සඳහා ය. එහි උපදේශක තුමන් ලෙස කටයුතු කළ මහාචාර්ය නන්ද ධර්මරත්න මහතාට සහ අංශ ප්‍රධාන වරුන් ලෙස කටයුතු කළ මහාචාර්ය මණ්ඩාවල මැතිතුමාට සහ පද්මසිරි කන්නන්ගර මැතිතුමන්ට ද ගැටලු සහගත අවස්ථාවල දී ලබා දුන් සහයෝගය පිළිබඳ ස්තුතිවන්ත විය යුතු ය.

මෙම පාඨමාලාවේ සම්මන්ත්‍රණ පත්‍රිකා ඉදිරිපත් කිරීමේ දී සහභාගි වූ කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අංශයේ මහාචාර්ය ජෝර්ජ් කුරේ මහතාට ද මහාචාර්ය ක්‍රිෂාන්ත දෙහෙරගොඩ මහතාට ද ස්තුති වන්ත විය යුතු අතර මෙම ඉදිරිපත් කිරීමේ දී මා හට බෙහෙවින් උපකාර කළ සමාජීය විද්‍යා අධ්‍යයන මණ්ඩල සභාපති මහාචාර්ය මයුර සමරකෝන් මැතිතුමාට සහ පශ්චාත් උපාධි පීඨයේ පීඨාධිපතිනි මහාචාර්ය පියසීලී මැතිණියට ද ස්තුති වන්ත විය යුතුය. තව ද මෙහි දී පරීක්ෂකවරුන් ලෙස කටයුතු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ හිටපු උප කුලපති සහ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ සේවාර්ජිත මහාචාර්ය එස්.බී. හෙට්ටිආරච්චි මැතිතුමාට සහ සර් ජෝන් කොතලාවල ආරක්ෂ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ පීඨාධිපති ආචාර්ය ප්‍රතිභා මහානාම මැතිතුමාට ද මාගේ කෘතඥතාව හිමිවිය යුතුය. එමෙන්ම මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම සඳහා තම දැනුම නොඅඩුව මා වෙත ලබාදුන් මාගේ උපදේශකතුමන් වූ මහාචාර්ය නන්ද ධර්මරත්න මහතාගේ අමිල මෙහෙයට මා සදා ණය ගැතිය.

තව ද සම්මුඛ සාකච්ඡා සඳහා කාලය ලබා දුන් සියම් නිකායේ කෝට්ටේ පාර්ශවයේ ගාලු තල්පේ පත්තුවේ අධිකරණ සංඝනායක පූජ්‍ය හුලන්දාවේ රතනසිරි නායක ස්වාමීන් වහන්සේටත් උඩරට අමරපුර නිකායේ රාස්සගල පාර්ශවයේ ප්‍රධාන අධිකරණ සංඝනායක පූජ්‍ය බලන්ගොඩ පියනන්ද ස්වාමීන් වහන්සේටත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බුවනෙක අළුවිහාරේ මැතිතුමාටත් අභියාචණාධිකරණ සභාපති විනිසුරු විජිත් මලල්ගොඩ මැතිතුමාටත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ජයන්ත ජයසූරිය මැතිතුමාටත් මහාධිකරණ විනිසුරු චන්ද්‍රසේන රාජපක්ෂ මැතිතුමාටත් මහේස්ත්‍රාත් හා අතිරේක දිසා විනිසුරු ප්‍රසන්න අල්විස් මැතිතුමාටත් බෙහෙවින් ස්තුති වන්ත විය යුතු ය.

ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය, කොළඹ විශ්වවිද්‍යාලවල රාජ්‍ය ලේඛණාගාරයේ කාර්ය මණ්ඩලයට සහ ජාතික කෞතුකාගාරයේ අධිකාරිතුමන් සහ පුස්තකාල කාර්ය මණ්ඩලයට ද මෙහි දී මාගේ ස්තුතිය පුද කළ යුතු වන්නේ පොත් පත් පරිශීලනයේ දී ලබා දුන් සහයෝගය නිසා ය.

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ම.ව. | මහාවංසය |
| දී.ව. | දීපවංසය |
| කෞ.අ.ශා. | කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය |
| නී. නි. | නීති නිඝණ්ඩුව |
| සී.හ. | සීතාවක හටන |

## කෙටි යෙදුම් (ඉංග්‍රීසි)

| | |
|---|---|
| **A. J.S.L.** | **Act of Judicature of Sri Lanka** |
| **C.B.B.** | **Ceylon Blue Books** |
| **C.C.** | **Conquest of Ceylon** |
| **C.C.P.** | **Colbrooke Camaroon Papers** |
| **C.D.** | **Celon Directory** |
| **C.P.C.** | **Civil Procedure Code** |
| **Cri. P. C.** | **Criminal procedure code** |
| **Dis.** | **Dispatches** |
| **E.Z.** | **Epigrapia zeylanica** |
| **In.C.** | **Inscriptions of Ceylon** |
| **N.L.R.** | **New Law Report** |
| **S.L.L.R.** | **Sri Lanka Law Report** |
| **S.P.** | **Sessional Papers** |

# පටුන


පිටුව

ස්තුතිය i

කෙටි යෙදුම් ii

## පළමු පරිච්ඡේදය

හැඳින්වීම සහ මූලාශ්‍රය පරිහරණය

1.1 පර්යේෂණයේ වැදගත්කම 1 - 9

1.2 මූලාශ්‍රය භාවිතය 9 - 13

1.3 පර්යේෂණයේ අරමුණ 13

1.4 පර්යේෂණ ක්‍රම වේදය 17

## දෙවන පරිච්ඡේදය

මෙරට නීති සහ නෛතික ආයතනවල ඓතිහාසික පසුබිම

2.1 අනුරාධපුර යුගයේ නීති හා අධිකරණ ක්‍රමවල ස්වාභාවය 18 - 36

2.2 පොළොන්නරු යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා පැවති නීති හා අධිකරණ පද්ධතිය 37 - 44

2.3 මහනුවර යුගයේ නීතිය හා අධිකරණ පද්ධතිය 44 - 52

## තුන්වන පරිච්ඡේදය

ක්‍රි.ව. 1500-1796 දක්වා නීති හා අධිකරණයෙහි විශේෂතා

| | | |
|---|---|---|
| 3.1 | පෘතුගීසින් විසින් නීති හා අධිකරණ පද්ධතියට සිදු කළ බලපෑම | 53 - 65 |
| 3.2 | ලන්දේසින් මෙරට නීති පද්ධතිය තුළ සිදු කළ වෙනස්වීම | 65 - 76 |
| 3.3 | ලන්දේසි පාලනය තුළ මෙරට අධිකරණ පද්ධතියේ සිදු කළ වෙනස්වීම | 76 - 83 |


## හතරවන පරිච්ඡේදය


බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාවේ නීතිය හා අධිකරණ ක්‍රමය

| | | |
|---|---|---|
| 4.1 | බ්‍රිතාන්‍යයන් යටතේ නීතියහා අධිකරණය ( 1796-1815 ) | 84 - 94 |
| 4.2 | 1815 පසු නව නීති හඳුන්වා දීම | 94 - 111 |
| 4.3 | 1815 පසු අධිකරණ පද්ධතිය | 111 - 128 |


## පස්වන පරිච්ඡේදය


නීතිය හා නෛතික ආයතනවල සිදු වූ වෙනස්කම් නිසා මෙරට සමාජය තුළ ඇති වූ ආර්ථික සමාජ විපර්යාස

| | | |
|---|---|---|
| 5.1 | 1505-1796 අතර සිදු වූ ආර්ථික සමාජ විපර්යාසය | 128 - 145 |
| 5.2 | 1796-1832 අතර සිදුවූ ආර්ථික සමාජ වෙනස්වීම | 145 - 151 |
| 5.3 | 1833-1948 දක්වා සිදුවූ ආර්ථික සමාජ වෙනස්වීම | 151 - 167 |

**නිගමනය සහ සමාලෝචනය** 168 - 174


## උපග්‍රන්ථ


| | | |
|---|---|---|
| 1. | 1815 උඩරට ගිවිසුම ( පැරණි අක්ෂරයෙන්) | 175 - 190 |
| 2. | 1815 උඩරට ගිවිසුම (මුද්‍රණ අකුරින් ) | 191 - 195 |
| 3. | 1818 උඩරටට නව නීති හඳුන්වා දුන් ආඥාව | 196 - 213 |
| 4. | 1818 විහාර දේවාල ගම් සම්බන්ධ නව නීති පැන වූ ආඥාව | 214 - 217 |
| 5. | යුද්ධාධිකරණ දඬුවම් ලේඛනය | 218 - 220 |

**සිතියම්**

| | |
|---|---|
| 1. 1766 වන විට ලන්දේසි පාලන ප්‍රදේශ | 221 |
| 2. 1833 පළාත් බෙදීම | 222 |

3. 18 වන සියවසේ අගභාගයේ ලංකාව 223

4. 19 වන සියවස වන විට පළාත් බෙදීම 224

5. ශ්‍රී ලංකාවේ මහා මාර්ග (1948) 225

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 226 - 235

## පළමුවෙනි පරිච්ඡේදය

# හැඳින්වීම හා මූලාශ්‍රය පරිහරණය

### 1.1 පර්යේෂණයේ වැදගත්කම

මෙම පර්යේෂණ නිබන්ධනයට පසුබිම් වී ඇත්තේ මෙරට අතීතයේ පැවති නීති හා නෛතික ආයතන යටත් විජිත පාලන සමයේ දී කෙබඳු වෙනස් වීම්වලට භාජනය වීද යන්න විමසා බැලීම යි. මෙහි දී වර්තමාන නීති හා අධිකරණ ක්‍රියාවලිය ආරම්භ වූයේ බටහිර ජාතීන්ගේ පාලන සමයේ දී බැවින් එයට පෙර පැවති නීතිය කුමක්ද? නෛතික ආයතන කවරේද ? යන්න පිරික්සා බැලිය යුතු ය. වසර 2500 ක අඛණ්ඩ ලිඛිත ඉතිහාස සම්ප්‍රදායකට උරුමකම් ඇති මෙරට පැවති ශිෂ්ටාචාරය කෙබඳුද යන්න විවිධ පර්යේෂකයන්ගේ පර්යේෂණ මගින් ලොවට හෙළිදරව් කර ඇත. මෙරට දේශපාලනික, ආර්ථික, සමාජ හා සංස්කෘතික අංශ අළලා එක් එක් යුග ද පදනම් කරගෙන පර්යේෂණ කෘති රාශියක් පළවී ඇත. එහෙත් මෙරට නීතිය හා අධිකරණ පද්ධතිය පිළිබඳව පළවී ඇති පර්යේෂණ කෘති ප්‍රමාණය ඉතා අල්ප ය. නීති හා අධිකරණ ක්ෂේත්‍රය අළලා ලියන ලද කෘති බොහෝමයක්ම රචනා කර ඇත්තේ නීතිවේදීන් ය. මේ නිසා ඒවායේ ඓතිහාසික හා සාමාජික දෘෂ්ඨිය ගිලිහීගොස් ඇත. තවත් වරෙක හේලි වැනි පර්යේෂකයින්ගේ කෘතිවල සිංහල නීති හා අධිකරණ ක්‍රමය ගැන ලියවුන ද ඒවා බටහිර ජාතීන්ගේ පාලන සමයේ කෙබඳු වෙනස් වීම් වලට භාජනය වූයේ ද යන්න විමසා බලා නැත.

මේ නිසා වසර 2500 ක ඉතිහාසයක් ඇති මෙරට නීති හා නෛතික ආයතන ද පැවති ස්වභාවය සහ ඒවා බටහිර ජාතීන්ගේ පාලන සමයේ වෙනස්වීම් වලට ලක් වූ ආකාරය විමසා බැලීම මෙම අධ්‍යයනයට පසුබිම් වී ඇත.

අධ්‍යයනයේ වැදගත්කම පිළිබඳව සලකා බලන විට මෙරට ඉතිහාසයේ අඛණ්ඩව ලිඛිතව වසර දෙදහස් පන්සියයක පවතින බව අපි දනිමු. යට කී වසර දෙදහස් පන්සියයක් පාලනය ආරම්භ වන්නේ විජයාවතරණයත් සමඟ යි. විජය මෙරට රාජාවලියෙහි ආරම්භක පාලකයා ය. විජය රජුගෙන් ආරම්භ වී 1815 දක්වා ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසින් විසින් අල්ලාගෙන යන තෙක්ම වසර දෙදහස් තුන්සියයකට අධික කලයක්

මෙරට පැවතියේ රාජාණ්ඩුවකි. තත් කාල පරිච්ඡේදය තුළ මෙරට පැවති නීති හා නෛතික ආයතන මොනවාද යන්න විමසා බැලීම වැදගත් ය.

එහි දී පැරණි නීති හා නෛතික ආයතන පිළිබඳව විමසීමේ දී නීතිය යනු කුමක්දැයි විමසා බැලීම අවශ්‍ය ය. මක්නිසාද යත් නීතිය ද මානව ශිෂ්ටාචාරයේ විකාශනය තරම් පැරණි වන නිසා ය. Ancient laws it's connection with the history of society නම් ග්‍රන්ථය සම්පාදනය කළ සර් හෙන්රි මේන් දක්වා ඇත්තේ අතීතයේ පුද්ගලයා මුල්කරගත් පවුල් එකතු වී ගෝත්‍ර සෑදුණු බවත් ගෝත්‍ර එකතු වී රාජ්‍ය සෑදුනු බවත් ය. ඔහු වැඩිදුරටත් පෙන්වා දුන්නේ ඥාතීත්වය තුළින් සමාජය නිර්මානය වූ බවත් සමාජයන් තුළින් රාජ්‍ය බිහිවූ බවත් ය.[1] මේ අනුව රාජ්‍ය යන සංකල්පය මානව ශිෂ්ටාචාරයේ විකාශනයකි. ගෝත්‍ර සමාජ තුළ වේවා දියුණු සමාජයේ වේවා එක් එක් රාජ්‍ය තුළ වේවා ඒ ඒ ගෝත්‍රයට, සමාජයට, රටට, ආවේණික නීති පවතී. මෙහි දී අප රටේ පාලන තන්ත්‍රයේ දී උපයෝගී කරගත් නීති හා නෛතික ආයතන පිළිබඳව විමසා බැලීම ඓතිහාසික වශයෙන් වැදගත් ය.

නීතිය රාජ්‍ය පාලනයේ දී වැදගත් වන ආකාරය විමසා බැලීමට ග්‍රීක දාර්ශනිකයෙකු වූ ප්ලේටෝ නීතිය පිළිබඳව දක්වා ඇති අදහස විමසා බැලිය යුතුය. ''නීතියේ ආධිපත්‍යය රටක් තුළ ක්‍රියාත්මක වීම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඉවහල් වන ක්‍රියාමාර්ගයකි. පිළිගත් නීති පද්ධතියක් මත රටක් පාලනය වීම මින් අදහස් වේ.'' යනුවෙන් ප්ලේටෝ ප්‍රකාශ කර ඇත.[2] නීතිය යනු කුමක්ද යන්න විමසා බැලීමේ දී එම පැනයට ලැබෙන පිළිතුර එකවර ලබා දීම අපහසු ය. නීතිය පිළිබඳව පෙර අපර දෙදිග දාර්ශනිකයන් විවිධ අදහස් එල කර ඇත. මානව චර්යාවන් හසුරවනු ලබන රීති පද්ධතිය නීතිය බව බොහෝ විචාරකයින්ගේ මතය යි. ග්‍රීක ජාතික ඇරිස්ටොටල් නීතිය යනු තාර්කික බුද්ධියේ උත්තරීතර එලය බව ප්‍රකාශ කර ඇත.[3] ප්ලේටෝ නීතිය යනු සමාජය පාලනය කිරීම බව දක්වා ඇත.

මේ අනුව රාජ්‍යයක පාලනය විධිමත් වීමට නම් නීති අවශ්‍යය. වසර දෙදහස් පන්සියයක් මෙරට පැවති පාලනය කුමන නීති හා අධිකරණ

[1] Henry main, ancient law it's connections with the early history of society, and it's relations to modern ideas, London, John marry com., 1861, p.63
[2] Allen R.E., Plato : the republic new heaven : Yale University Press, 2006, p.73
[3] Boorker, Sir Earnest, the political thoughts of plato and aristotal, London, p 48

පද්ධතියක් මත ක්‍රියාත්මක වීදැයි යන්න හා එම පද්ධතිය වෙනස් වූ ආකාරය විමසා බැලීම මෙහි දී වැදගත්ය. යට දැක්වූ නිර්වචන අනුව නීතිය යනු පාලනයේ දී වැදගත් අංගයක් බව පැහැදිලි වේ. රාජ්‍යයක් පාලනය සඳහා නීති රීති සම්ප්‍රදායන් තිබිය යුතුය. නීති රීති නොමැති වූ විට පාලනයක් සිදු නොවේ. මෙරට ඉතිහාසය දෙස බැලීමේ දී ඓතිහාසික යුගය ආරම්භ වූයේ විජයාවතරණයත් සමඟ ය. එතැන් පටන් රාජ්‍ය පාලනය පිළිබඳ තොරතුරු දැකගත හැකි ය. එකී පාලන තන්ත්‍රය කුමක් වුවත් ඊට ආධාර වූ නීති රීති සම්ප්‍රදායන් විමසා බැලිය යුතු ය. මෙහි දී අප අතීතයෙන් මෙරට පැවති නීතිරීති හා නෛතික ආයතන පිළිබඳවත් එම නීති රීති හා නෛතික ආයතන බටහිර ජාතින්ගේ පාලන සමයේ දී කෙබඳු වෙනස් වීම් වලට ලක් වූයේ ද යන්නත් විමසා බැලිය යුතු ය.

මෙම පර්යේෂණයේ වැදගත්කම පිරික්සා බලන විට වසර දෙදහස් පන්සියයක අඛණ්ඩ ලිඛිත ඉතිහාසයකට උරුමකම් කියන මෙම ශිෂ්ටාචාරය තුළ පැවති පාලනයට අදාළ නීති මොනවාද යන්නත් එම නීති පැවතියේ නම් ඒවා ලේඛනගත නීති ලෙසත් හඳුන්වාදිය හැකි ය. ලේඛනගත නීති අතීතයේ දී මෙරට පැවතියේ නම් මෙරට ලිඛිත ඉතිහාස සම්ප්‍රදායට සමගාමීව නීති සාහිත්‍යයක් ගොඩනැගුනේ ද යන්නත් පිරික්සා බැලිය යුතු ය.

යථෝක්ත කරුණු විග්‍රහ කර බැලීමේ දී පළමුවෙන්ම අපට පැහැදිළි වන්නේ අතීතයේ දී මෙරට පාලනය සඳහා උපයෝගී කරගත් නීති බොහෝවිට දැඩි අනම්‍යය ලිඛිත ව්‍යවස්ථාවන් නොව සාම්ප්‍රදායික රීතින් ඇතුළත් නෛතික සම්ප්‍රදායක් බවයි. විශේෂයෙන්ම පෙර සිරිත ආරක්ෂා කිරීම සෑම පාලකයෙකුගේම අදහස වූ බව පැහැදිළි වේ. මෙරට බලයට පත් වූ දේශීය හා විදේශීය, බෞද්ධ හා අබෞද්ධ සෑම පාලකයෙකුම චාරිත්‍රානුකූලව කටයුතු කර ඇති බවට කදිම සාක්ෂ්‍යයක් වන එළාර රජු චාරිත්‍රානුකූලව භික්ෂු සංඝයා වහන්සේලාට දන් පිළිගැන්වීම යි. එළාර හැරුණුවිට දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය දේශයේ සිට පැමිණි පරාක්‍රම පාණ්ඩ්‍ය වැනි කුමාරවරුන් ද මෙරට පැවති නීති, සම්ප්‍රදායන් උල්ලංඝනය නොකරමින් රාජ්‍ය පාලනය කළ බව පැහැදිලි වේ. අනුරාධපුර පොළොන්නරුව වැනි යුගවල සිටි පාලකයන් මෙන්ම මහනුවර යුගයේ දී ද බලයට පත් වූ පාලකයන් වන නායක්කාර වංශික කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද රාජ නීතිය ද ධර්මය ද නො ඉක්මවමින් රාජ්‍ය අනුශාසනා කර ඇත. මේ

අනුව මෙරට සිටි සෑම පාලකයෙක්ම පෙර සිරිත අනුව රට පාලනය කිරීමට ප්‍රයත්න දරා ඇති බව පැහැදිලි වේ.

මෙරට පැවති නීතිය වූයේ පෙර සිරිත පමණක් ද යන්න මීලඟට පිරික්සා බැලිය යුතු ය. එහි දී පැහැදිලි වන්නේ කලින් කල සිටි පාලකයන් විසින් ලිඛිත ව්‍යවස්ථා ද හඳුන්වාදෙනු ලැබූ බව යි. පැරණි සෙල් ලිපිවල අන්තර්ගත කරුණුවලින් එය පැහැදිලි වේ. වේවැල්කැටිය ලිපිය, කොන්ඩුවටුවාන ලිපිය සහ බදුලු ටැම් ලිපිය වැනි ලිපිවලින් මෙරට අතීතයේ දී පැනවූ ලිඛිත ව්‍යවස්ථා අනාවරණය වේ. එ මෙන්ම වසභ රජුගේ (ක්‍රි.ව. 67-111) පෙරිමියන්කුලම සෙල්ලිපියේ[4] සහ ගෝඨාභය රජුගේ කාලයට (ක්‍රි.ව. 249-262) අයත් තිඹිරිවැව සෙල් ලිපියේ[5] පාරම්පරික ඉඩම් බුක්තියට අදාළ නීති සඳහන් වෙයි. එ මෙන්ම ඉඩම් අඳ ක්‍රමයට වගා කළ බව පූජාවලියෙන්ද පැහැදිලි වේ.[6] රජු විසින් ලබාදුන් ඉඩම් දිවෙල් ක්‍රමයට බුක්ති විඳීම ගැන හිඟුරක් දමන දෙමළ සෙල් ලිපියේ සඳහන් වේ.[7] එසේම දිවෙල් ඉඩම් බුක්තියට අදාළ කරුණු ගඩලාදෙණිය සෙල් ලිපියෙහි ද දැක්වේ.[8] රම්බාව පුවරු ලිපියේ හතර වන මිහිඳු රජු විසින් කළ ඉඩම් ප්‍රදානයන් පිළිබඳව දැක්වේ.[9]

පස්වෙනි කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ සඳහන් වන්නේ වරක් දඬුවම් කළ අයෙකුට නැවත දඬුවම් නොකළ යුතු බව යි.[10] එය වර්තමාන නීතියේ එන Double Jeapady යන සංකල්පයට සමානම වූවකි. නිශ්ශංකමල්ල රජුගේ ගල් පොත ශිලා ලේඛනයේ සඳහන් වන්නේ මහා පරාක්‍රමබාහු රජු පෙර සිරිත නොසළකා කටයුතු කිරීම නිසා දුෂ්කරතාවයන්ට පත් මහජනයාට සහන සැලසූ බවයි.

පොළොන්නරු යුගය වන විට පැවති නීතිරීති පිළිබඳව ද සෙල් ලිපි මගින් තොරතුරු අනාවරණය වේ. සහස්සමල්ල රජු විසින් කරන ලද කෙවුල්ගම සෙල් ලිපියේ සඳහන් වන්නේ ඉඩම් ලබාදීමේ දී මායිම් වෙන්කර

---

[4] EZ Volume 1, No 6 p. 69
[5] EZ Volume 2, No 3 p. 24
[6] සිරිවීර, ඉන්ද්‍රකීර්ති, ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය ක්‍රි.ව 1500 දක්වා ඇස්. ගොඩගේ සහෝදරයෝ, 1993 පි. 106
[7] Epigraphia Tamilica K. Indrapala, Volume 1 No, 1 pp. 14-17
[8] EZ Volume 4, No 3 pp. 21-23
[9] EZ Volume 2, No 12 p. 66
[10] EZ Vol. 1, p. 41

ලබාදුන් බවයි.[11] මෙයට අමතරව දඹදෙණි යුගයට අයත් කොට්ටන්ගේ පළමු සෙල් ලිපියෙහිද ඉඩම් ලබා දීමේදී සීමා ලකුණු කළ බව දක්වා තිබේ.[12] හයවන පරාක්‍රමබාහු රජතුමා බමුණන් දෙදෙනෙකුට ඉඩම් ලබා දීමේ දී සීමා ලකුණු කර ලබාදුන් බව ඔරුවල සන්නසින් පැහැදිලි වේ.[13] මෙහි දී සීමා ලකුණු කොට ඉඩම් ලබාදීමේ සාමය ආරක්ෂා වීම සිදුවිය.

සෙල් ලිපි මගින් භික්ෂූන් වහන්සේලාගේ නීති පිළිබඳව ද තොරතුරු අනාවරණය වේ. එහි දී විහාරාරාම පාලනය සම්බන්ධ තොරතුරු මිහින්තලා පුවරු ලිපිය, අභයගිරි සංස්කෘත ලිපිය කලුදිය පොකුණ ලිපිය සහ ගල්විහාර කතිකාවත, දඹදෙණි කතිකාවත ප්‍රමුඛ කතිකාවත්වලින් ද තහවුරු වේ. භික්ෂු විනය පිළිබඳව විමසා බලන විට බුද්ධ ශාසනයේ එන ත්‍රිපිටකයෙන් එක් පිටකයක්ම වෙන් කර ඇත්තේ විනය සඳහා ය. විනය ශාසනයේ ආයුෂ බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. මේ අනුව මහින්දාගමනයත් සමඟ මෙරට සංඝ සමාජය ප්‍රභවය වන අවස්ථාවේදීම විනය පිළිබඳ වැදගත් සංස්ථාවක් මෙරට බිහිවිය. විනය පිරිහී යන අවස්ථාවල දී නැවත සංඝායනාවන් පවත්වා විනය ස්ථාපිත කර ඇත. එහි දී කතිකාවත් කරවා ඇත්තේ විනය නීති රීති සෙසු අයට දැන ගැනීම සඳහා ය. සංඝ සමාජය තුළ විනය පිළිබඳව කොතරම් ස්ථාවර භාවයක් පැවතියේ ද යත් විනය නීති රීති පිළිබඳව දැනුමක් ඇති භික්ෂූන් වහන්සේලා සංඝාධිකරණ කටයුතුවල නියැලී ඇති. එ මෙන්ම ඇතැම් අවස්ථාවදී බෞද්ධ භික්ෂූන් වහන්සේලා පැවිදි විනය පිළිබඳව පමණක් නොව ගිහි විනය පිළිබඳව ද කටයුතු කරන විනිශ්චය කාරවරුන් වශයෙන් කටයුතු කර ඇත. ගෝඨදත්ත හිමියන් පිළිබඳව එන පුවත එබන්දකි. [14]

ගිහි ජනතාවට පමණක් නොව බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද අයත් ලිඛිත ව්‍යවස්ථාවන් පනවා ඇති බව ගල් විහාර කතිකාවත, දඹදෙණි කතිකාවත වැනි කතිකාවත් පිරික්සා බැලීමේ දී පැහැදිලි වේ. ඒ අනුව මෙරට පාලකයින් ගිහි පැවිදි දෙපක්ෂයටම අදාළ නීති පැනවීමේ දී ඊට ප්‍රමුඛත්වය ලබා දී ඇත.

---

[11] EZ Volume 3, No 23 pp. 233-234

[12] EZ Volume 4, No 17 p. 87

[13] EZ Volume 3, No 3 pp. 64-65

[14] බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. අටුවා පරීක්ෂණය හා අටුවා කථා වස්තුව, විද්‍යාලංකාර මුද්‍රණාලය, පෑලියගොඩ, 1915, පිටු. 126 - 128

මෙරට පැවති බෞද්ධ විනය නීතිරීති පිළිබඳව වැදගත් තොරතුරු රැසක් ආදි බුදු සමයෙහි පෙනෙන නීති දර්ශනය නම් කෘතියෙහි ලලිත් රණසිංහ මහතා විසින් දක්වා ඇත.[15]

මෙයින් ද පැහැදිලි වන්නේ මෙරට පිළිගත් නීති රීති, සම්ප්‍රදායන් පැවති බව යි.

අනුරාධපුර, පොළොන්නරු යුග වලදී මෙන්ම දඹදෙණි යුගයේ ද පෙර සිරිත භාවිතා වූ බවත් එහිදී පෞද්ගලිකත්වය බලපාන නීති තිබුන බව ද පැහැදිළි වේ. උදාහරණයක් වශයෙන් කාන්තාවකට වයස අවුරුදු 16 සම්පූර්ණ වීම විවාහයට සුදුසු වයස බව "එවක පටන් සොළොස් හැවිරිදි වන තුරු මව්පියන් අතරේ රඳවා එවකට සරණ හිදිනා වයස් හෙයින් " යනුවෙන් සද්ධර්මරත්නාවලියේ සඳහන් වීමෙන් පැහැදිලි වේ.[16] සද්ධර්මාලංකාරයෙන්ද කුමාරිකාවන් වැඩි සොළොස් හැවිරිදි වියට පැමිණි කල් හි යනුවෙන් සඳහන් වීමෙන් මෙය තවදුරටත් තහවුරු වේ.[17] මේ අනුව අනුරාධපුර, පොළොන්නරු යුග වල පැවති නීතිය හා සම්ප්‍රදාය පසුවද පැවති බව පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ පැරණි නීතිය සහ අධිකරණ ක්‍රමය පිළිබඳව අධ්‍යයනයක යෙදුන පී. මනම්පේරි දක්වන්නේ පැරණි ලක්දිව නීතියට පාදක වූ මූලාශ්‍රයන් හයක් පැවති බවයි.[18] ඒවා නම් :

1. උත්තර භාරතීය නීති ක්‍රම හා සිරිත්
2. දක්ෂිණ භාරතීය නීති ක්‍රම හා සිරිත්
3. පූර්ව චාරිත්‍ර
4. ගම් සිරිත්
5. කුල සිරිත්
6. බෞද්ධ ධර්මය හා සිරිත්

---

[15] ලලිත් රණසිංහ, අදි බුදු සමයෙහි පෙනෙන නීති දර්ශනය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ 1994, පි. 27

[16] සද්ධර්මරත්නාවලිය සංස් : ඩී.බී. ජයතිලක, ලංකාභිනව විශ්‍රැති මුද්‍රණාලය, 1936 පි. 315

[17] සද්ධර්මාලංකාරය සංස් : බී. සද්ධාතිස්ස හිමි, පානදුර මුද්‍රණාලය, 1948 පි. 88

[18] මනම්පේරි පී, පුරාථන ලංකාවේ නීතිය හා අධිකරණය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1988, පි. 25

මෙයට අමතරව ශ්‍රී ලංකාවේ පැරණි නීතිය සහ අධිකරණ ක්‍රමය පිළිබඳව අධ්‍යයනයක යෙදුන ආචාර්ය එම්.එල්.එස්. ජයසේකර මහතා පැරණි ලක්දිව නීති සම්ප්‍රදාය සකස්වීමේ දී බලපා ඇති මූලාශ්‍රයන් කිහිපයක් මෙසේ දක්වයි.[19]

1. හින්දු නීති හා චාරිත්‍ර

2. ආගමික ලේඛන හා ව්‍යහාරයන් සහ බෞද්ධ චාරිත්‍ර

3. ශාක්‍ය හා මෞර්ය චාරිත්‍ර

4. පෙර සිරිත්

5. කුල සිරිත්

6. ගම් සිරිත්

7. දකුණු ඉන්දීය චාරිත්‍ර

යථෝක්ත අයුරින් නීති සම්ප්‍රදායන් පැවති නමුත් ඒ පිළිබඳව විද්වත් පරීක්ෂකවරුන්ගේ අවධානය යොමු වී ඇත්තේ මද වශයෙනි. සිංහල නීති හා චාරිත්‍ර පිළිබඳව අධ්‍යයනයක යෙදුන F.A. හේලි ඔහුගේ කෘතිය වන A Treatise on the laws and customs of the Sinhalies නම් කෘතියෙහි සිංහල චාරිත්‍ර හා නීතිය පිළිබඳව වැදගත් තොරතුරු සඳහන් කර ඇත. ඔහු විශේෂයෙන්ම මහනුවර යුගය වන විට මෙරට දක්නට ලැබුණ සිරිත්, විරිත්, සම්ප්‍රදායන් පිළිබඳව සඳහන් කරයි එම කෘතියේ දී මෙරට සෙල් ලිපිවල තිබූ ලිඛිත නීති පිළිබඳව එතරම් අවධානය යොමු කර නැත. එ බැවින් මා විසින් මෙම අධ්‍යයනයේ දී මෙරට පැවති පැරණි ලිඛිත නීති පිළිබඳව ද අවධානය යොමු කරන ලදි.

එ මෙන්ම එච්.ඩබ්. තම්බයියාගේ Judicature of Sri Lanka. නම් ග්‍රන්ථය මෙරට නීති ඉතිහාසය පිළිබඳව අධ්‍යයනය කරන විට වැදගත් වන නමුත් එහි දී අනුරාධපුර, පොලොන්නරුව යුග පිළිබඳව අවධානය යොමු කර නැත. ආචාර්ය එම්.ජේ. ඒ. කුරේ මහතා ශ්‍රී ලංකාවේ උසාවි හා නීති ක්‍රම යනුවෙන් ග්‍රන්ථයක් සම්පාදනය කර ඇති අතර එහි දී සමස්ථ නීති ක්‍රම පිළිබඳවම සංක්ෂිප්ත විග්‍රහයක් කර ඇත. එහි දී පුළුල් ලෙස කරුණු විග්‍රහ

[19] Jayasekara M.L.S. The Sources of Sinhalese Customary laws, The journal of Ceylone law, volume 1 No, 1 p. 81